# පුස්කොළ අධ්‍යයනයේ භාවිත පාරිභාෂිත ශබ්ද

- පහලගම ධම්මික හිමි

ඥාණය ගබඩා කිරීමේ ආරක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ලේඛනගත කිරීම සිදු කරන ලදි. කිසියම් කරුණක් හෝ කරුණු සමුදායක් ලේඛනය කොට ගබඩා කිරීම එකල පැවති ක්‍රමය වූයේ තල කොළ තුළ සටහන් කිරීමයි. ඒ සඳහා තල ගස උපකාර කර ගන්නා ලදි. තල ගසෙන් සකස් කොට ගන්නා ලද තල කොළ මත ලේඛනය සිදු කිරීම විය. ලේඛන ක්‍රමය තුළ දී තල ගසේ කොළය හෙවත් තල පත්‍රය හඳුන්වන්නේ පුස්කොළය නමිනි. පුස් යන්න සඳහා ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය අර්ථ සපයන්නේ කිසිවක් නොලියන ලද කොළය නමිනි. එසේ වුවත් පුස් කොළ පොත යන්නෙන් ව්‍යාවහාර කරන්නේ තල කොළවල ලියන ලද ලේඛනය යන්නයි. තල ගසේ තල ගොබය සුදුසු ආකාරයට සකස්කර ගැනීම ප්‍රථමයෙන් සිදු කරනු ලබයි. අතීතයේ දී මිනිසා තම ඥාණය ලියා තැම්පත් කිරීම සඳහා පුස්කොළ පොත භාවිත කළේය. අග්නිදිග ආසියාතික රටවල් වන බුරුමය, තායිලන්තය, ඉන්දියාව, වැනි රටවල්වල පුස්කොළ ලේඛනයේ භාවිතය බෙහෙවින් දැක ගත හැකිය.

පුස්කොළ ලේඛන කලාවේ ආරම්භය ක්‍රි:පූ: 88 - 75 දක්වා දිවයයි. අනුරාධපුර රාජධානියේ දෙවැනි වරට අභිශේක ලැබූ වලගම්බා රාජ කාලය දක්වා පුස්කොළ ලේඛන කලාවේ ඉතිහාසය ගමන් කරයි. වලගම්බා රජතුමා විසින් ඉදිකරන ලද අභයගිරිය කුපික්කලතිස්ස හිමියන්ට පූජා කොට ඇත්තේ පුස්කොළ ලේඛනයක් තුළිනි. එකී පූජා සන්නස් පත සකස්කොට ඇත්තේ වැටකෙයියා පත්‍රයකින් බව වැඩිදුරටත් දැක්වෙයි. ඉන් පසු ලක්දිව විවිධ ප්‍රදේශවල පුස්කොළ ලේඛන කලාව පැතිරී ගොස් තිබේ. මහින්දාගමනයෙන් අනතුරුව ලේඛන කලාව වඩාත් දියුණු තත්ත්වයට පත්වූ බව සිතීමට සාධකය වන්නේ දඹදිවින් මෙහි පැමිණි පිරිස් අතරෙහි ලේඛන කලාව සම්බන්ධ අය සිටීමයි. මහින්දාගමනයෙන් පසු පුස්කොළ ලේඛනය ආරම්භ වූ බව පෙනෙයි. පුස්කොළ අධ්‍යයනයේ

භාවිත පාරිභාෂිත ශබ්ද රැසක් වේ. ඒ අතර,

- තල ගොබය
- කරකොළය
- පුස්කොළය
- වට්ටු
- රතගෑම
- කළු මැදීම
- කුණ්ඩලය
- පත්තුල
- පත්කට්ටුව
- කම්බා
- සකියා
- හුය
- පන්හිඳ[1]

ආදී වශයෙන් නොයෙක් ආකාරයේ පාරිභාෂික ශබ්ද මාලා දක්නට ලැබේ. මේ ශබ්ද සියල්ල පුස්කොළ පොත් හා සම්බන්ධ වූ නම් හා කාර්යයන් හඳුන්වන ව්‍යවහාරික පද මාලාවන්ය. එම පදයන් තුළින් කිසියම් ක්‍රියාවලියක් හෝ එසේ නොවන්නේ නම් කිසියම් උපකරණයක් හඳුන්වනු ලබයි. එම නාමයන් දේශීය සංස්කෘතිය නියෝජනය වන වදන්ය. එයින් ගැමි දිවිය හා අත්‍යන්තයෙන් බැඳි ජීවන වටපිටාව කියාපායි. පුස්කොළ ලේඛනය සිදු වීමේ දී එය කිසියම් කාලයක් තුළ සිදු කරන්නා වූ ක්‍රමානුබද්ධ ක්‍රියාදාමයකි. එය එක විටක හෝ යුහුසුළුව සිදු කළ හැකි කඩිනම් ක්‍රමයක් නොවේ. එහි පියවර කීපයක් දැකිය හැකිය. ලේඛනය සඳහා උචිත තල ගසක් සොයා ගැනීම පළමුවෙන් ම සිදු කරයි. ඉන් අනතුරුව,

- තල ගස ලකුණු කර ගැනීම
- තල ගොබය කපා ඉවත් කර ගැනීම
- තල ගොබය ලිහා ගැනීම
- තල කොළ තුළින් තල කුරු ඉවත් කිරීම
- වට්ටු සකස් කිරීම
- තල කොළ තම්බා ගැනීම

- තල කොළ වේළා ගැනීම
- වේළාගත් තල කොළ නැවත වට්ටු බවට පත් කිරීම
- තල කොළ නියමිත ආකාරයට කපා ගැනීම
- තල්පත්වල සිදුරු විද ගැනීම
- රත ගෑම
- අක්‍ෂර ලිවීම
- කළු මැදීම
- සුද මැදීම
- වියළීම
- සුදුසු ආකාරයට කම්බා නිර්මාණය කිරීම
- හුය නිර්මාණය කිරීම
- සකියා නිර්මාණය කිරීම
- පොත බැඳීම

මෙසේ සකස් කොට ගත් ලේඛනය පුස්කොළය වශයෙන් හඳුන්වයි. එය නිමි පුස්කොළ ලේඛනයකි. ඉන් පසු එකී ලේඛනය සුරක්‍ෂිත කිරීමට කිසියම් වැඩ පිළිවෙලක් සකස් කර ගනී. එබඳු පැරණි පුස්කොළ ලේඛන රාශියක් ලක්දිව පුස්තකාල හා විහාරස්ථාන මෙන්ම පුද්ගලයන් සතුව පවතී. ඒවා අතර,

01. ත්‍රිපිටකය හා ඊට අදාළ අටුවා ටීකා සන්න ආදිය ලියන ලද පුස්කොළ පොත්.
02. දේශිය වෙද හෙදකම පිළිබඳ ලියන ලද පුස්කොළ පොත්
03. යන්ත්‍ර මන්ත්‍ර ආදී ගුප්ත විද්‍යාවන් ලියන ලද පුස්කොළ පොත්
04. නිධන් වදුල්
05. නින්දගම් ආදිය පිළිබඳ තොරතු ඇතුළත් පුස්කොළ පොත්
06. සන්දේශ ආදිය ලියන ලද පුස්කොළ පොත්
07. තනතුරු නම්බු නාමාදිය පිළිබඳ ලියන ලද පුස්කොළ පොත්
08. විහාර දේවාලගම් පිළිබඳ පුස්කොළ පොත්.
09. සීමා මායිම් ආදී සඟ සතු දෑ පිළිබඳ පුස්කොළ පොත්
10. විවිධ ලෞකික විෂයන් ලියන ලද පුස්කොළ පොත්

වශයෙන් ලක්දිව තොරතුරු ඇතුළත් පැරණි ලේඛන රාශියක්

පුස්කොළ පොත් වශයෙන් රට අභ්‍යන්තරයේ දක්නට ලැබේ. ඉන් සමහරක් ලේඛන වටිනාකමින් අධිකය. විවිධාකරයේ ගැටලු ප්‍රශ්න නිරාකරණයට පුස්කොළ පොත් භාවිතයෙන් ලැබෙන ආලෝකය ඉමහත්ය. මෙම සෑම පුස්කොළ පොතක්ම අධ්‍යයනයේ දී හමු වන පාරිභාෂික වදන් මාලාවක් වෙයි. ඒවා පහත පරිදිය.

## තල ගොබය

ලක්දිව තල් ගස හා තල ගස  යනුවෙන් ගස් වර්ග දෙකක් හමුවෙයි. මේ ගස් දෙවර්ගයම තාල වර්ගය නියෝජනය කරයි. පොල්, පුවක්, කිතුල් ආදිය එකම පවුලේ ගස්ය. මේ ගස් මිනිසාට බෙහෙවින් ප්‍රයෝජනය පිණිස පැවතීම මෙම කුලයේ ගස්වල ස්වරූපය වෙයි. සමහරක් ගස්වල ඵල මිනිසාට ඉතා ප්‍රයෝජනවත් වුවත් ගසෙන් හෝ කොළවලින් කිසිදු ප්‍රයෝජනයක් නැත. තාල වර්ගයේ ගස්වලින් විවිධාකරයේ ප්‍රයෝජන රාශියක් වේ. තල් ගස නැගෙනහිර මුහුදුබඩ ප්‍රදේශවල හා යාපන අර්ධද්වීපයේ බෙහෙවින් හමුවේ. රට අභ්‍යන්තරයේ ද අතරින් පතර හමුවෙයි. එයින් පුස්කොළ සඳහා දායකත්වයක් නොගනී. පැල්මේ (ඇරිකේසියා) (Palamae arecaceae) කුලයට අයත් වන ශාඛයකි, තල ගස. මෙම ගසේ නිජ බිම ශ්‍රී ලංකාව වෙයි. $2000c^0$ අඩු උෂ්ණත්වයක් සහිත දේශගුණික කලාපවල අඩු වශයෙන් තල ගස දැකිය හැකිය.[2] පුස්කොළ සඳහා භාවිත කර ගන්නේ තල ගසයි. එහි ගෙඩි හට නොගනී. එක වරක් පමණක් ගසේ මල් හටගනී. ඉන් පසුව ගසේ අවසානයත් සිදු වෙයි. එම නිසා ගැමියන් තුළ තල ගස පිළිබඳ අස්ථාන බියක් ඇති බව පෙනෙයි. බොහෝ සෙයින් තල ගසක් වැඩී ගෙන එද්දී එය කපා දැමීට ගැමියන් තුළ මිත්‍යා මතය ඉහල ගොස් ඇති බව පෙනෙයි. එසේම රටේ මධ්‍යම පළාතේ යම් යම් ප්‍රදේශවල තල ගස ප්‍රයෝජනය සඳහා යොදා ගනී. ඒ පුස්කොළ පොත් කර්මාන්තය සඳහාය. තල ගසේ සියලු ම තල අතුවලට උඩින් අලුතින් එන තල කොළ හඳුන්වන්නේ තල ගොබය නමිනි. තල ගසක් පීදීගෙන එන විට තල ගසේ ගොබයට උණ පතුරු වළලු දමා ඉහිරීම වළක්වා ගනී. ඉන් පසු පුස්කොළ පොත් සඳහා අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීම සඳහාය. පුස්කොළ සකස් කිරීමේ දී ඉතා වැදගත් වන්නේ තල ගොබයයි.

## කරකොළය


තල ගොබයෙන් ලබා ගන්නා වූ පියවි කොළ මේ නමින් හඳුන්වයි. පුස්කොළ ලිවීම සඳහා කටයුතු කරන ආධුනිකයන් කර කොළය මත ලියනු ලබයි. පදම් කළ හෝ නොකළ තල කොළ මේ සඳහා භාවිත කරනු ලබයි. අමු තල කොළ ද මේ සඳහා භාවිත කරයි. පුස්කොළ අක්ෂර ලිවීම පිළිබඳ අත පොත් තැබීම හෙවත් මූලික පුහුණු ලබා ගන්නා අවධියේ භාවිත කරන තල කොළ කරකොළ වශයෙන් නම් කර ඇත.

## පුස්කොළය

තල කොළය අක්ෂර ලේඛනයට සකස් කොට ගත් පසු පුස්කොළය නමින් හඳුන්වයි. පුස යනුවෙන් ධාතුවක් තිබේ. එයින් ප්‍රකාශ වන්නේ පිසීම (පිසදැමීම) යන ක්‍රියාවයි.[3] එසේම පුස් යන නාමය පදයට අර්ථ කීපයක් දක්වයි. 01. තෙත් දෙයෙහි හැදෙන ඉතාමත් කුඩා වූ හතු වෙසෙසක් වූ ද්‍රව්‍යයකි. 02. හිස්, පුහු, 04. වැල් ජාතියක්. 05. කිසිවක් නො ලියූ හිස් තල කොළය. 06. පොතක් මෙන් සකස් කළ තල කොළ මිටිය.[4] මෙහි දී භාවිතය සන්දර්භ කීපයක් දක්වා තිබේ. ලක්දිව පුස් යනුවෙන් හැඳින්වෙන වැල් වර්ගයක් ද තිබේ. තල කොළ මිටිය යන්නෙන් කියවෙන්නේ ලේඛනය හා බැඳි පුස් කොළය. තල ගොබය කපාගත් පසු අවස්ථා කීපයකින් පසු පුස් කොළය බවට පත්කර ගනී. මූලික වශයෙන් කපාගත් තල ගොබය විහිදුවා තල කුරු ඉවත් කරයි. ඉන් පසු තල කොළ පහළවක් විස්සක් අතර ප්‍රමාණයක් එක මත එක තබා රෝල් කර ගනියි. ඒවා වට්ටු නමින් හඳුන්වයි. ඒවා තම්බා ගනී. කොළ මැදීම සිදු කරන්නේ ඉන් පසුවයි. ලිහින ලද තල කොළ නැවත වාරයක් වට්ටු වශයෙන් බැඳ ගනී. සිදුරු විදීම හා කොළ කැපීම ක්‍රමානුකූලව සිදු කරනු ලබයි. ඉන් පසු නොලියන ලද කොළ සහිත පොත පුස්ගෙඩිය නමින් හඳුන්වයි. මේ අවස්ථාව දක්වා තල කොළ යන නමින් ක්‍රියාත්මක වී මින් පසු ව්‍යාවහාර වන්නේ පුස්කොළ නමිනි. ඒ පිසින (පිසදමන ලද) ලද කොළ යනුවෙන් සුමංගල ශබ්දකෝෂය අනුව අර්ථවත් කළ හැකිය.

## වට්ටු

තම්බා ගැනීම තෙක් නිසි පිළිවෙලකට තල කොළ තැම්පත් කොට තිබිය යුතුය. එසේ නොවුව හොත් කොළ විසිරී පැටලීමත් විනාශවීමත් සිදු විය හැකිය. එසේ ම නොබැඳ තැබූ තල කොළ අක්‍රමවත්ය. එම නිසා තල කොළ තබ්බා ගන්නා තෙක් තල කොළ රෝලක් සේ ඔතා ගනී. එහි දී විශේෂයෙන් තල කොළයේ තල කූර ඉවත් කර ඇති නිසා රෝල් කිරිම අපහසුවක් නොමැතිව සිදු කළ හැකිය. එක මත එක සිටින සේ තල කොළ තබා රවුම් කර ගනී. සාමාන්‍යයෙන් ලොකු හැළියක කටට කුඩා වන ප්‍රමාණයට තල කොළ රවුම් සකස් කර ගනී. මෙම සකස් කර ගන්න තල කොළ රවුම් හඳුන්වන්නේ වට්ටු නමිනි. මේ පුස්කොළ පොත් සකස් කිරීමේ දී වට්ටු බැඳීමේ ප්‍රථම අවස්ථාව මෙය වෙයි. තලකොළ කර්මාන්තයේ දී හමු වෙන සුවිශේෂ ව්‍යවහාරයක් වශයෙන් වට්ටු යන්න පෙන්වා දිය හැකිය. තල කොළ තම්බා ගැනීමට වට්ටු බැඳීම පහසුවක් වෙයි. වට්ටු තම්බා ගත් පසු රෝල් ලිහා මඳ අව්වෙහි වෙළාගනී. මදින ලද තල කොළ නැවත වරක් රවුම් කර බැද තබයි. එය දෙවැනි වරට වට්ටු බැඳීමයි. ඒවා මදින ලද වට්ටු වශයෙන් හඳුන්වයි.



(සකස්කර ගන්නා ලද වට්ටු)

**රතගෑම**

රත ගෑම සිදු කරන්නේ සිදුරු විද කපා ගත් තල කොළවලය. පත්තුල නම් උපකරණයෙන් රත ගෑම සිදු කරයි. පුච්චන ලද පොල් කටු අඟුරු මත දමා පත්තුල ගිනියම් කර ගනී. ඉන් පසු අච්චුවේ ඇති කපා ගත් තල කොළවල දාරයේ පත්තුල අතුල්ලයි. එයින් සිදු වන්නේ තල කොළවල නිමාව උසස්වීමයි. එමෙන් පාරිසරික කාරණා කීපයක් එයින් ඇති වෙයි. උෂ්ණයට හා අධික ශීතල ඔරොත්තුදීමේ

හැකියාව පිළිස්සීමෙන් ඇති වෙයි. එමෙන්ම ගුල්ලන් කාවන් වැනි කුඩා ජීවීන්ගේ ග්‍රහණයට අපහසු වෙයි. අලංකාරවත් බවක් ඇති වෙයි.

## කළු මැදීම

අකුරු ලේඛනය කළ තල කොළ තුළ එය පැහැදිලිව නොපෙනෙයි. ඒ සඳහා කළු මැදිය යුතුයි. එනම් ලියන ලද කොළ මත විශේෂයෙන් සකස් කර ගත් ද්‍රාවනයක් ආලේප කිරීම මෙහි සිදු කරන කාර්යය වෙයි. කළු මැදීම සඳහා සාදාගන්නා වූ ද්‍රාවනය පිළිබඳ විවිධ මත පවතී. දොරණ තෙල්, හා ගැඩුම ගසේ අඟුරු වලින්ද සකස් කරගනියි. එසේම තනිකර කපු පුළුන් රෙදි කැබැල්ලක් පුළුස්සා ගෙන රන් තැඹිල් තෙල් සමග මිශ්‍ර කොට ගන්නා බව ද ප්‍රකාශ වෙයි. එසේ ම කැකුණ ගෙඩි හා වල් කැප්පිටියා කොළ ගන්නා බව තවත් අදහසකි. කෙසේවෙතත් කළු මැදීම සඳහා සකස් කර ගත් ද්‍රාවනය ලියා ගත් කොළයේ අක්ෂර මත ආලේප කරයි. ඉන් පසු කුරක්කන් පිටි දමා හොඳින් පිරිසිදු කර ගනී. මෙම ක්‍රමවේදය වෙනස්කම් ප්‍රදේශ අනුව සිදු වන බව පෙනෙයි. මූලික වශයෙන් කළු මැදීමෙන් සිදු වන්නේ ලියන ලද අකුරු හොඳින් දර්ශනය වීම සිදු කිරීම හා කොළයේ ආරක්ෂාව ඇති වීමයි.

## කුණ්ඩලය

සාමාන්‍යයෙන් ලේඛනය තුළ වාක්‍යක් හෝ වාක්‍යංශයක් ඉදිරිපත් කොට එය අවසාන බව දක්වන්නේ නැවතීමේ තිත තුළිනි. ගාථා හෝ ශ්ලෝක බන්ධනයේ දී ඒ සඳහා යතිය භාවිත කරයි. වුත්තෝදය යතිය හඳුන්වා ඇත්තේ ''පදච්ඡෙදො යතිබ්බහවෙ''[5] යනුවෙනි. පාද අතර හෝ පද අතර විරාමය දක්වන්නේ යතිය තුළිනි. වෘත්තරත්නාකරය ''යතිර්විච්ඡේද සංඥිකා'' යනුවෙන් පැහැදිලි කරන්නේ මෙකී නැවතීමේ සළකුණයි. පුස්කොළ ලේඛනයේ දී නැවතීම ප්‍රකාශ කරන්නේ කුණ්ඩලය නැමැති සංඥාව තුළිනි.

## පත්තුල

පත්තුල රතගෑම සඳහා භාවිත කරන උපකරණයකි. මෙහි පැතලි තලයක් වෙයි. පැතලි තලයේ සිට මිට දිගට නිර්මාණය කොට තිබේ.

පොල් කටු අඟුරු පුළුස්සා ඉන් ගිනියම් කොට ගන්නා පත්තුලෙන් කපා ගත් තල කොළේ දාර මත තබයි. එය හැඳින්වෙන්නේ රතගෑම වශයෙනි. ඉන් පුස්කොළවලට අලංකාරයක් මෙන් ම ආරක්ෂාවක් ලැබෙයි.

## පත්කට්ටුව

තල කොළ තම්බා ගෙන පදම් කොට අවශ්‍ය ප්‍රමාණයක කැපූ පසු එම කොළ හඳුන්වන්නේ පත් ඉරු නමිනි. ඒ පත් ඉරු මත ලිවීමට හැකියාව තිබේ. පදම් කොට ගත් පත් ඉරු කීපයක් එක් කොට ගත්විට එය හඳුන්වන්නේ පත්කට්ටුව නමිනි. පත්කට්ටු සකස්කොට ගන්නේ ලියන පොතේ අවශ්‍ය ප්‍රමාණයටය. පත්කට්ටුවක් පත්කට්ටු කීපයක් එක පොතක් ලීවිමට අවශ්‍ය වෙයි.

## කම්බා

ලේඛනය කළ පුස්කොළයේ ආරක්ෂාව හා අලංකාරවත් බව ඇති වන්නේ කම්බා තුළිනි. කම්බා යනු පුස්කොළයේ පිට කවරයයි. ඕනෑම පොතක ආරක්ෂාව රඳාපවතින්නේ පොතේ පිට කවරය හේතු කොට ගෙනය. පොතට මනා පෙනුමක් කම්බය තුළින් ලැබෙයි. පොත් කම්බය නිර්මාණාත්මක මෙන් ම අලංකාරාත්මක වන සේ සකස් කරගැනීම සඳහා රන්, රිදී, වෙනත් ලෝහ වර්ග, ඇත් දළ, දැව ආදී අමුද්‍රව්‍ය භාවිත කරයි. බහුලවශයෙන් හමුවන පොත් කම්බ සකස් කොට ඇත්තේ දැවයෙන් කළ ඒවාය. එහි විවිධ මෝස්තර චිත්‍රණය කොට ඇත. විවිධ වර්ණ භාවිත කරමින් එය සිදු කොට තිබේ. ලිය වැල් විවිධ මෝස්තර, සත්ත්ව රූප, සටහන් ආදිය එහි සිතුවම් වශයෙන් දක්වා ඇත. සමහර කම්බ කැටයම් කොට තිබේ. ලී පෘෂ්ඨය මත ගිල්වුම් කැටයම් වශයෙන් සකස් කොට තිබේ. එහි ද ලිය වැල් ආදී මෝස්තර ඇතුළත් වෙයි. ඇත් දළ මත ද සියුම් කැටයම් කළ පොත් කම්බ දැක ගත හැකිය. සමහරක් ලී කම්බවල මැණික ආදිය ඔබ්බවා තිබේ. කම්බය තුළින් පුස්කොළයට මනා නිමාවක් ගෙන දෙයි. එසේම ගම්භීරබවක් ද ඇති කරවයි.



(පොත් කම්බා)

**සකියා**

සකියා කම්බයට පිටතින් පිහිටුවා ඇත. හුය ගැලවී පුස්කොළ විසිරීයාම වළක්වා ගැනීමට සකියා උපකාරී වෙයි. පුස්කොළය බැඳීමේ දී බැම්ම තදවීමට සකියා හේතු වෙයි. පොත් කම්බයට පිටතින් බොත්තමකට සමානව දක්නට ඇත්තේ සකියාය. සකියා නිර්මාණය සඳහා විවිධ ලෝහ වර්ග භාවිත කරයි. රන්, රිදී, පිත්තල වැනි ලෝහ වලින් සැකසූ සකියා දැක ගත හැකිය. ඇත් දත්, සතුන්ගේ අං, කාසි, මැණික් ආදී විවිධ දෑ සකියා සඳහා භාවිත කොට තිබේ. එයින් ප්‍රධාන වශයෙන් පොතේ ආරක්ෂාව සිදු වෙයි. එසේම පුස්කොළයට අලංකාරයක් ගෙන දෙයි.


**හුය**

හුය නමින් හඳුන්වන්නේ පුස්කොළ පොත බඳින නූලය. පුස්කොළය මැදි කොට කම්බය තද වන සේ බඳින්නේ හුයෙනි. කොළ විසිරී යාම වළක්වා ගැනීමට හුය බෙහෙවින් ආධාර වෙයි. හුය සකස් කරගන්නේ කපු නූල් හෝ නියද කෙඳි වලිනි. ඊට අමතරව වෙනත් වර්ණවත් නූල් වර්ග භාවිත කරනු ලබයි. පුස්කොළ පොතේ අලංකාරය වැඩි කර ගැනීම සඳහා විවිධාරයේ නූල් භාවිත කරන බව පෙනෙයි. ඉන් අලංකාරය පමණක් නොව පුස්කොළයට ආරක්ෂාවක් සැලසේ.

**පන්හිඳ**

සකස් කර ගත් තල ඉරු මත ලේඛනය කරන්නේ පන්හිඳෙනි. එය සියුම් තුඩක් සහිත පෑනකි. තීන්ත භාවිත නොකරන අතර තියුණු වානේ තුඩින් තල පත මත අකුරු කෙටීම සිදුවෙයි. පුස්කොළ

ලේඛනය සඳහා භාවිත කරන උපකරණය පන්හිඳ නමින් හඳුන්වයි. පන්හිඳ තුඩ හැරුණු විට අනෙක් කොටස් බොහෝ විචිත්‍රවත් සේ සකස් කොට තිබේ. සමහරක් ඒවා රන් රිදී ආදී ලෝහමය වේ. ඇත් දත් ආදියෙන් අලංකාර කළ ඒවා ද දක්නට ලැබේ. විවිධකාරයේ වර්ණයන්ගෙන් හා කැටයමින් කළ පන්හිඳ හමුවෙයි. පුස්කොළ මත අක්ෂර ලේඛනය සඳහා භාවිත වන පන්හිඳ නම් අකුරු ලිවීමට ගන්නා උපකරණයයි.



පන්හිඳ

පුස්කොළ පොතක් වශයෙන් නිමාවට පත්වන්නේ තල ගසේ ගොබයත් සකස් කරගත් සුවිශේෂී වූ අංග කීපයක්ය. එය දීර්ඝ කාලයක් පවතින්නා වූ ගුණයෙන් යුක්ත වෙයි. එසේම දේශීය වශයෙන් පෞඪත්වය කියාපාන්නා වූ සාධකයකි. ඊට හේතුව පුස්කොළ ලේඛන කලාවේ විශේෂතාවයි. පුස්කොළ අක්ෂරකරණයේ දී අකුරුවල ප්‍රමාණ තුනක් භාවිත කරයි. ඒවා අක්ෂර ශෛලිය වශයෙන් හඳුන්වයි.

01. හස්ති ශෛලිය
02. හංස ශෛලිය
03. කාක ශෛලිය

වටකුරු වූ අක්ෂරවලට හස්ති ශෛලිය වශයෙන් සඳහන් කරයි. චතුභාණවර පාලියේ ලියා ඇති අකුරුය. ත්‍රිපිටකය හා වෙනත් සාහිත්‍ය පොත පත ලියා ඇත්තේ හංස ශෛලියෙන්ය. අක්ෂරයක ඉස්පිල්ල පාපිල්ල තුළින් අනෙක් අක්ෂර කැපී යන්නා සේ කරන ලේඛනය කාක ශෛලිය නම් වෙයි. විශේෂයෙන් යන්ත්‍ර මන්ත්‍රාදිය ලියන්නේ මෙම ශෛලියෙනි.

පුස්කොළ අධ්‍යයනයෙහි භාවිත වන පාරිභාෂිත වදන් රාශියක්

හමු වෙයි. ඒ වචන අතර ප්‍රාදේශීය වශයෙන් වෙනස් වචන ද දැක ගත හැකිය. විශේෂ වශයෙන් සුද මැදීම, පොත් ලේන්සුව, මදින ගල, සුළි කැපීම, හංස පාදය, දණ්ඩාසනය, පෙයියාලම ආදී පද හමුවෙයි. ඒ සෑම පදයක් ම කිසියම් ක්‍රමවේදයක් හෝ ක්‍රමයක් ඇති උපකරණය හැඳින්වීම පිණිස වේ.

## ආන්තික සටහන්


1. ඇහැලේපොල, දීපාංජනී, තල්පත් ලිවීම, 2007, බෞද්ධ සංස්කතික අරමුදලේ ප්‍රකාශන, 17-18 පිටු.
2. ලගමුව, ආරිය, ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, 2006, සංස්කෘතික කටයුතු දේපාර්තමේන්තුව, 185 පිටුව.
3. සොරත හිමි, වැලිවිටියේ, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ද්විතීය භාගය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 395 පිටුව.
4. එම, 631 පිටුව.
5. ධම්මරක්ඛිත හිමි, උදම්මිට, වුත්තෝදය, 1916, 02 පිටුව.